# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

## පරිසර අමාත්‍යාංශය

# ඇබෑර්තු

## ජාල / දෘඩාංග කාර්මික සහකාර

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත මගින් පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පවතින පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ජාල / දෘඩාංග කාර්මික සහකාර - MA 2-2**

**බාහිර අපේක්ෂකයන්**

**වෘත්තීය සුදුසුකම්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level - 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයන්**

**වෘත්තීය සුදුසුකම්**

ඉහත සඳහන් පරිදි බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 පරිදි වන වැටුප් පරිමාණය**

MA 2-2 රු. 30,310-10x300-7x350-4x600-20x710-52,360

**තනතුරට අදාළ වන පොදු කොන්දේසි :**

- තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදල වෙත ඔහුගේ වැටුපින් 10% ක දායකත්වයක් ලබා දිය යුතුය. කාර්යාංශය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 15% ක දායකත්වයක්ද එයට අමතරව සේවක භාරකාර අරමුදල සඳහා 3% ක දායකත්වයක්ද ලබා දෙනු ලැබේ.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය සඳහා හිමිකම
- බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා හිමිකම
- අයදුම්කරු පිළිබඳව ප්‍රත්‍යක්ෂණය කර ගැනීම සඳහා ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතේ සඳහන් කළ යුතුය.
- අධ්‍යාපනික හා අනෙකුත් අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය.

අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර 2022-03-11 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**